# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,073 - 2018 මැයි මස 25 වැනි සිකුරාදා - 2018.05.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | 966 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 973 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2018 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජූනි මස 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූනි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී පවතින පහත තනතුරු සඳහා මෙම නිවේදනයේ සුදුසුකම් සපුරා ඇති පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | සේවා ශ්‍රේණිය | වැටුප් පරිමාණය | බඳවා ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්, අමතර සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක | 01 | PL1 – 2016 ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය III ශ්‍රේණිය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි PL1 – 2016 වැටුප් ඛණ්ඩය අනුව රු. 24,250 - 250 x 10 - 270 x 10 -300 x 10 - 330 x 12 - රු. 36,410 මාසික වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමි වේ. සේවයේ නියුක්ත කරවන දිනට ඉහත කී චක්‍රලේඛයේ උපලේඛන II හි PL 1- 2016 වැටුප් ඛණ්ඩයේ ආරම්භක වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ. | * බාහිර අයදුම්කරුවන් සඳහා - (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකින් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර) * අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා - (ආ) දැනට පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 9 වසර (8 ශ්‍රේණිය) සමත් විය යුතුය. |
| 02 | ප්‍රජා ශාලා භාරකරු | 01 | | | |
| 03 | පුස්තකාල සහායක | 01 | | | |
| 04 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 06 | | | |

1. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :

   1.1 සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු අතර මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

   1.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

   1.3 පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතුයි.)

2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

   2.1 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

   2.2 පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. පරිවාස කාලය තුළ සිය වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන තිබේනම් සහ පළමු කාර්යක්ෂමතා විභාගය සමත් වී ඇත්නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ.

   2.3 1/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 2007.07.01 වැනි දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

3. බඳවා ගැනීමේ ක්‍රමය :

3.1 අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියළු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. සුදුසුකම් සහිත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේ දිනය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයට පහත සඳහන් ලිපි ලේඛන හා ඒවායේ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකයේ මුල් පිටපත;
(ii) අධ්‍යාපන සහතික වල මුල් පිටපත්;
(iii) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iv) මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය;
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;
(vi) සේවා සහතික;
(vii) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික.

3.2 සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතුරින් වඩාත් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගෙන තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

4. අයදුම් කළයුතු ආකාරය :

4.1 නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිතා කර සකසන ලද අයදුම්පතක් 2018.06.29 වැනි දින හෝ ඊට පෙර "ලේකම්, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව, හෙට්ටිපොල" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4.2 අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරු නාමය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

4.3 අයදුම්පතෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු/සාමාදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු විසින් සහතික කළයුතුය.

4.4 දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත තමන් සේවය කරන ආයතනයේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

4.5 අසම්පූර්ණ හෝ නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

බඳවා ගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක දිනය පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් නිශ්චය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන ලද කාලය අතරතුර කාල සීමාවේ හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

**එච්. ඒ. ජී. නිශ්ශංක,**
ලේකම්.
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

2018 මැයි මස 25 වැනි දින,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**. ආදර්ශ අයදුම්පත්‍රය**

***වයඹ පළාත් රාජ්‍ය සේවයේ පඩුවස්නුවර ප්‍රදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ............................................ තනතුරට බඳවා ගැනීම***

01. සම්පූර්ණ නම :——————————————.
02. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
03. ස්ථිර ලිපිනය :——————————————.
04. ස්ත්‍රී/පුරුෂභාවය :——————————————.
05. විවාහක/අවිවාහක බව :——————————————.
06. දුරකතන අංකය :——————————————.

07. උපන් දිනය : වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

08. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : වර්ෂ: ☐☐ මාස: ☐☐ දින: ☐☐

09. අධ්‍යාපන සුදුසුකම් :

අවසන් වරට සමත් ශ්‍රේණිය :—————————.

අ.පො.ස. සා.පෙළ :

පෙනී සිටි වර්ෂය :————— විභාග අංකය :—————

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

10. ඔබ කවදා හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

11. අයදුම්කරුගේ ප්‍රකාශය :

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරාගැනීමට පෙර හෙළිවුවහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුස්සෙකු වීමට ද, මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටද යටත් වන බව දනිමි.

.............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................................මයා මා පෞද්ගලිකව හොඳින් හඳුනන බවත් ඔහුගේ අත්සන .............................. දින මා ඉදිරිපිට දී තබන ලද බවත් සහතික කරමි.

.

.................................
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :—————.
සම්පූර්ණ නම :—————,
තනතුර :—————;
ලිපිනය :—————;
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

13. රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ අයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියාගේ සහතිකය

ඉල්ලුම්කරු වන .............................................................. මයා./මිය. අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ / පළාත් සභාවේ /ආයතනයේ ස්ථිර/අනියම්/තාවකාලික නිලධාරියෙකු ලෙස සේවය කරන බවත් ඔහුගේ වැඩ, හැසිරීම සතුටුදයක බවත්, මෙම තනතුර සඳහා ඔහු තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි /නොහැකි බවත් සහතික කරමි.

....................................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හෝ බලය පැවරූ
නිලධාරියාගේ අත්සන.

දිනය :——————
සම්පූර්ණ නම :——————
තනතුර :——————
ලිපිනය :——————
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

05-567

---

## බොරලැස්ගමුව නගර සභාව

බොරලැස්ගමුව නගර සභාවේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෙනත් සුදුසුකම්* | *බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|---|---|---|
| 01 | රියැදුරු | 01 | රා. පරි. චක්‍රලේඛ 3/2016 අනුව PL3 රු. 25,790/- 10x270 -10x300 -10x330 -12x350- රු. 38,990 | විවෘත බඳවා ගැනීම් අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතයට හා සිංහල භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 6 කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයන් 5 ක් එකවර සමත් විය යුතු ය. | බඳවා ගන්නා දිනට අවුරුදු 03 කට පෙර අවම වශයෙන් සී සහ සී 1 රියැදුරු බලපත්‍රයක් තිබීම (නව ක්‍රමයේ බී ඛණ්ඩයේ බලපත්‍රය) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබීම තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. | වෘත්තිය පරීක්ෂණයකින් සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| 02 | සෞඛ්‍ය කම්කරු | 03 | රා. පරි. චක්‍රලේඛ 3/2016 අනුව PL1 රු. 24,250/- 10x250 -10x270 -10x300 -12x330 - රු. 36,410 | 8 ශ්‍රේණිය/(9 වසර) සමත්ව තිබිය යුතු ය. | තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් | බඳවා ගැනීමේ ක්‍රමය |
|---|---|---|---|---|---|---|
| 03 | ආදහනාගාර සහායක | 01 | රා. පරි. චක්‍රලේඛ 3/2016 අනුව PL1 රු. 24,250/- 10x250 -10x270 -10x300 -12x330 - රු. 36,410 | 8 ශ්‍රේණිය/(9 වසර) සමත්ව තිබිය යුතු ය. | තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කෙරේ. |

02. බඳවා ගැනීම සඳහා වන පොදු කොන්දේසිඃ

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

iii. සෑම අයදුම්කරුවෙක්ම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් තුළ බස්නාහිර පළාතෙහි ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය. බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

iv. අයදුම්කරුවන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබුවෙක් නොවිය යුතු ය.

v. රාජ්‍ය සේවයෙන්, පළාත් රාජ්‍ය සේවයෙන් හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබුවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතු ය.

vi. සෑම අයදුම්කරුවෙක්ම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. මෙම වයස් සීමාවන් පිළිබඳ කොන්දේසි දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.

vii. බොරලැස්ගමුව නගර සභාවේ දැනටමත් අනියම් ආදේශක හෝ ව්‍යාපෘති මට්ටමේ සේවයේ යෙදෙන සතුටුදායක සේවා තත්ත්වයකින් යුතු අය කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

viii. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය බොරලැස්ගමුව නගර සභාවේ ලේකම් සතු වන අතර, අදාළ විය හැකි සාධාරණ හේතු මත මෙම නිවේදනය සංශෝධනය කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය බොරලැස්ගමුව නගර සභාවේ ලේකම් සතු වේ.

03. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අරමුදල යටතේ වන දායක මුදල් ගෙවිය යුතු ය.

II. පත්වීමේ දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂක කාලයකට සීමාවකට යටතේ වේ.

III. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව, ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, හා මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය කොමිෂන් සභාවේ හෝ බොරලැස්ගමුව නගර සභාව විසින් වරින්වර නිකුත් කරන නියෝග රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට ද බැඳී සිටිය යුතු ය.

IV. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.

04. අයදුම් කළ යුතු ආකාරය :

මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ආකෘතිය පරිදි (12"x8" ප්‍රමාණයේ) අයදුම්පතක් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම් පස ඉහළ කෙළවරේ ලියා 2018.06.25 වැනි දිනට පෙර "ලේකම්, බොරලැස්ගමුව නගර සභාව බොරලැස්ගමුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.). නියමිත දින පසුවී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය
II. අධ්‍යාපන සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතික
III. පදිංචිය සනාථ කිරීම සඳහා මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය. (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන කර තිබිය යුතු ය.)
IV. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්
V. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික
VI. දැනට සේවය කරන්නේ නම් සේවා සහතිකය
VII. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

*සැ. යු.* - මෙම නිවේදනය සංශෝධනය කිරීම සඳහා කල් දැමීම හෝ අවලංගු කිරීම යන සියලු බලතල බොරලැස්ගමුව නගර සභාවේ ලේකම් සතු වේ.

ලේකම්,
බොරලැස්ගමුව නගර සභාව.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බොරලැස්ගමුව නගර සභාවේ පුරප්පාඩු පවතින ............................... තනතුර සඳහා බඳවා ගැනීම***

01 මුලකුරු සමග නම : ———.
02 මුලකුරුවලින් හැඳින්වෙන නම් : ———.
03 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ———.
04 ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම : ———.
05 ස්ථිර ලිපිනය : ———.
06 ජාතික හැඳුනුම්පත් අංකය : ———.
07 ස්ත්‍රී/පුරුෂ භාවය : ———. විවාහක ද/ අවිවාහක ද යන වග : ———.
08 උපන් දිනය : ———. අවුරුද්ද : ———, මාසය : ———, දිනය : ———.
09 ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : ———. අවුරුදු : ———, මාස : ———, දින : ———.
10 බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කාලය : ———.
11 ශ්‍රී ලංකා පුරවැසියෙකු ද නැත් ද යන වග : ———.
12 අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) : ———.
(1) සමත් වූ වසර/ශ්‍රේණිය : ———.
(2) අ. පො. ස. (සා.පෙළ විභාගය) : ———.
විභාග අංකය : ———.
විභාග වර්ෂය හා මාසය : ———.

සමත් වූ විෂයයන් :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

(3) අ. පො. ස. (උ.පෙළ) විභාගය : ———.

විභාග අංකය : ———.
විභාග වර්ෂය හා මාසය : ———.

සමත් වූ විෂයයන් -

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

13 වෘත්තිමය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතු ය.) : ———.

14 සේවා පළපුරුද්ද : ———.

(i) දැනට සේවය කරන ආයතනය : ———.
(ii) දැනට දරන තනතුර : ———.
(iii) එම තනතුරට පත් වූ දිනය : ———.
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර : ———.

15 ඔබ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද : ———.

16 මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද, මා කිසිඳු අධිකරණයකින් වරදකරුවෙකු වී දඬුවමකට යටත් වී නොමැති බවත්, මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ———.

*දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ................................... මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................ ........ වශයෙන් සේවයේ කරයි. ඉහත තනතුරට තෝරා පත්කර ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

........................................
දෙපාර්තමේන්ත ප්‍රධානියාගේ අත්සන

නම : ———,

පදවි නාමය : ———,

දෙපාර්තමේන්තුව / ආයතනය : ———,

(නිල මුද්‍රාව යොදන්න)

දිනය : ———.

05 - 605

# පළාත් පාලන නිවේදන

## ගාල්ල මහා නගර සභාව

### මහා නගර සභා ආඥාපනතේ 71 (1) වගන්තිය යටතේ (252 අධිකාරය) කරනු ලබන දැන්වීම

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වීථි නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනතේ තුන්වන වගන්තිය මගින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ 71 (1) වගන්තිය ප්‍රකාරව (252 අධිකාරය) කටයුතු කරමින් දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ග ඉදිරියෙන් දක්වන පරිදි නම් කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

වාසනා පී. ගුණරත්න,
නාගරික කොමසාරිස් හා ප්‍රධාන විධායක නිලධාරි,
ගාල්ල මහා නගර සභාව.

2018 මාර්තු මස 20 වැනි දින,
මහා නගර සභා කර්යාලය,
ගාල්ල.

#### උපලේඛනය

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *මාර්ගය අලුතින් නම් කර ඇති නාමය* |
|---|---|---|---|---|
| 01. | හැව්ලොක් පෙදෙස | ගාමිණී මාවත | පුඤ්ඤසාර මාවත | මහාචාර්ය බන්දුසේන ගුණසේකර මාවත, හැව්ලොක් පෙදෙස |
| 02. | ශ්‍රී සුමංගල තිලකාරාම පන්සල පාර | දේවසුරේන්ද්‍ර පාර | විස්කම් පාර | පූජ්‍ය කොග්ගල සංඝතිලක නාහිමි මාවත |
| 03. | ගාමිණී මාවත | වක්වැල්ල පාර | හැව්ලොක් පාර | ආචාර්ය මාම්පේ විමලකිත්ති නාහිමි මාවත |
| 04. | මහමෝදර වත්ත මාර්ගය | ගාලු කොළඹ පාර | මහමෝදර ගඟ අසලින් | සඳරැස් මාවත |
| 05. | මින්රෝ රෙස්ට් හෝටලය අසල හමුවන පළමු තාර දැමූ පාර | මින්රෝ රෙස්ට් අසල ධර්මපාල මාවත | වරිපනම් අංක 17/4 වන නිවාසය පිහිටි ඉඩම | අරුණ පෙදෙස |
| 06. | මින්රෝ රෙස්ට් හෝටලය අනෙක් පසින් පිහිටි තාර දැමූ පාර | මින්රෝ රෙස්ට් අසල ධර්මපාල මාවත | මොරගොඩ ඇළ පාර හා කුඩා ගෙදර වත්ත පාර එක්වන තුන්මංහන්දිය | හරිත පෙදෙස |

05 - 609

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG 5/4/K/4 හා2018.01.04 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහාද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් වේ නම් මෙම දැන්වීම පළ කළ දින සිට මාස 03 ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළයුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

01. පාරේ නම - හිරිවඩුන්න දියගම ප්‍රධාන මාර්ගයේ පන්සල හන්දියේ සිට ආරම්භ වන කලුගල්ල මාර්ගය දක්වා දිවෙන විහාර මාවත

වසම - දියගම

දිග - අඩි 870


පළල - අඩි 10

*පාරේ වම්පස*

1. රංජිත් ආනන්ද විජේවර්ධන
2. පී. පී. දයානන්ද
3. ඩබ්. සිරිලාල් ජිනදාස
4. අසිත තරංග ප්‍රේමසිංහ
5. බන්ධුල මහානාම ප්‍රතිරාජ

*පාරේ දකුණුපස*

1. සරත් විජේසිංහ
2. එස්. ජී. කේ. වික්‍රමසිංහ


එච්. එම්. ආර්. ටී. කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවිකොමසාරිස් සහ තක්සේරුකරු
අංක 86/04, ජයවිම මාවත
දුලුග්ගල, රඹුක්කන
035-2266422
077 4973610
ලි.ප. අංක 19831492
පිඹුරු අංකය. 4428/02
සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව
25 MAY 2018
2012.10.07
පරිමාණය 1 - 1000
විස්තර සඳහා පසුපිට බලන්න

02. පාරේ නම - නිමල්මල්ගොඩ නන්දන උයන වත්ත මාර්ගය

වසම - නිමල්මල්ගොඩ වසම

දිග - මීටර් 110.30

පළල - අඩි 10

*පාරේ වම්පස*

01. ආර්. ඒ. බී. ධම්මික නවරත්න - නන්දන උයන වත්ත
02. එස්. ඒ. සී. එස්. සමරතුංග - නන්දන උයන වත්ත
03. ඩබ්. සෝමවතී - නන්දන උයන වත්ත
04. එච්. පී. ආර්. කේ. රූපසිංහ පෙරේරා - නන්දන උයන වත්ත
05. ඩී. පී. පී. ධම්මික - නන්දන උයන වත්ත


*පාරේ දකුණුපස*

01. ඒ. ආර්. සී. පී. කුමාර - නන්දන උයන වත්ත
02. ඒ. ආර්. එන්. පී. කුමාර - නන්දන උයන වත්ත
03. ඩබ්. ඒ. ජී. ජී. වනිගතුංග - නන්දන උයන වත්ත
04. එස්.ඒ. ඒ. ජේ. සමරතුංග - නන්දන උයන වත්ත
05. ඩබ්.ඒ. එස්. ජයසිංහ - නන්දන උයන වත්ත
06. එස්. ඒ. ඩී. සමරසිංහ - නන්දන උයන වත්ත

J.R.M.Bandara Jayakody
Licensed Surveyor, Leveller,
Court Commissioner,
"Mahinda", Molagoda,
Kegalle.

**Plan No. 16/829**

නිල්මල්ගොඩ නන්දන උයන වත්ත පාරය




Reference

| | |
|---|---|
| ST | Stake |
| CP | Cement Post |
| LF | Live Fence |
| OL | Old Land mark |
| B | Bank |
| EP | Electric Pole |
| TP | Telegraph Pole |
| IR | Ion Rod |
| EDn | Earth Drain |
| RW | Retaining Wall |
| Road(RDA) | Road(Road Development Authority) |

Scale 1:1000

PLAN

An allotment of Land marked Lot 1 being resurvey of the existing boundaries of road (From Edvin Wijeratne Mawatha To Nandana Uyana Road), land called RADDALA ESTATE alias NANDANA ESTATE,
situated at Bohara village, No.51A Nilmalgoda G.N.Division within Kegalle Pradeshiya Saba limit in Mawatha Pattu of Paranakuru Korale within

# KEGALLE DISTRICT
# SABARAGAMUWA PROVINCE

Bounded as described on Plan

| Length(m) | Width |
|---|---|
| 110.30 | More than 10Ft |

| Lot No | Extent | | | |
|---|---|---|---|---|
| | Ha: | A: | R: | P: |
| 1 | 0.0373 | 0 | 0 | 14.74 |
| Total | 0.0373 | 0 | 0 | 14.74 |

Containing Extent (0.0373Hec. – 0A. 0R. 14.74P)

Note :– 1. Boundaries surveyed as pointed out by the owners

සැබෑ පිටපතකි.

සභාපති
කෑගල්ල ප්‍රාදේශීය සභාව

2016/7/25

J.R.M. BANDARA JAYAKODY
Licensed Surveyor & Leveller
Court Commissioner & Valuer
"Mahinda" Molagoda - Kegalle.
Tel: 035-2223773

Surveyed on : 2016/03/22

03. පාරේ නම - මාබෝපිටිය දේවාල හන්දිය සිට ඉසෝදනවලහේන මාර්ගය

වසම - මාබෝපිටිය


දිග - මීටර් 370

පළල - අඩි 08

| *පාරේ වම් පස* | | *පාරේ දකුණු පස* | |
|---|---|---|---|
| 01. එල්. චන්ද්‍රවතී | - ඉසෝදනවලහේන | 01. උපාලි | - ඉසෝදනවලහේන |
| 02. එල්. ජනක චන්දන ලේකම් | - ඉසෝදනවලහේන | 02. හර්ෂක නලින් | - ඉසෝදනවලහේන |

එච්. එම්. ආර්. ටී. කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවිකොමසාරිස් සහ තක්සේරුකරු
අංක 86/04, ජයබිම මාවත
දුලුග්ගල, රඹුක්කන
035-2266422
077 4973610
ලි.ප. අංක 19831492

පිඹුරු අංකය. 281/2016



සැබෑ පිටපතකි.

ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

පරිමාණය 1 -500

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළයේ කඳුඅහ පත්තුවේ කෑගල්ල ප්‍රා.ලේ.කොට්ඨාශයේ කෑගල්ල ප්‍රා.සභා සීමාව තුළ මාබෝපිටිය ග්‍රා.නි වසමේ මාබෝපිටිය (වඩා නිවැරදිව ලෙස කම්මලවත්ත) ගමේ පිහිටි ඉස්සෝදනවලේ හේන නැමති ඉඩම (දැනට පවතින ප්‍රවේශ මාර්ගය) දැනට භූමියේ දැක්වෙන මායිම් අනුව මැන සාදන ලද.

පිඹුර

මායිම් - ඉහත පිඹුරේ දැක්වෙන පරිදි වේ.

සම්පූර්ණ බිම්ප්‍රමාණය

| කැබලි අංක | හෙක්ටයාර් | අ | රූ | පර්චස් | |
|---|---|---|---|---|---|
| 01 | 0.033640 | 0 | 0 | 13.30 | අවම පළල අඩි - 08 |

මැනීම: 2016-10-10

05-568